## බළන්ගොඩ නගර සභා විශේෂ මහා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා තානායම

දිනය : 2010.11.10

වේලාව : පෙ.ව.10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය :-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |

**සහභාගීනොවූවෝ :-**

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය :-**

| | |
|---|---|
| 01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර | ලේකම් |

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

2011 වර්ෂයේ අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීම සඳහා අද දින විශේෂ මහා සභා රැස්වීමක් කැඳ වූ අතර , ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා සහ මෙම රැස්වීම නැරඹීම සඳහා අපගේ ආරාධනය පිළිගෙන ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින සියළු නිලධාරී මහත්ම/මහත්මීන් පාසල් දරුවන් ඇතුළු සියළු දෙනාම ඉතාමත් ගෞරවයෙන් යුතුව පිළිගන්නා බව පැවසීය.

බළන්ගොඩ නගර සභාව මහජනතාවගේ අවශ්‍යතාවයන් මනා සේ හඳුනාගෙන කාර්යක්ෂමව , ඵලදායී සේවයක් ඉටුකරමින් අභිමානවත් පුරවරයක් බිහිකිරීම උදෙසා සෑම විටම කටයුතු කරනු ලබන ආයතනයක් ලෙස හැඳින්විය හැකි බව බැව් පැවසීය. 1991 වර්ෂයේ දී ප්‍රථමයෙන්ම විපක්ෂ මන්ත්‍රීවරයෙකු ලෙස පත්ව අවුරුදු 06 ක් විපක්ෂයේ සිට ලැබූ අත්දැකීම් පෙරටු කොටගෙන 1997 වර්ෂයේ පැවති පළාත් පාලන මැතිවරණයේදී මෙම සභාවේ සභාපතිවරයා ලෙස තේරී පත් වූ බව දැන්වූ අතර , අතිගරු ජනාධිපතිතුමාගේ සහ බළන්ගොඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සංවිධායක ගරු මොහාන් එල්ලාවල මැතිතුමාගේ උපදෙස් හා

මග පෙන්වීම සහ තමන් ලැබූ අත්දැකීම් උපයෝගී කරගෙන නගරය සංවර්ධනය කිරීමට දැඩි කැපවීමකින් කටයුතු කල බව දැන්වීය. එම කාර්යය ඉටුකිරීමේ දී මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් සහ ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයෙන් විශාල සහයෝගයක් ලැබුණු බවත් ,එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වර්ෂවල සබරගමුව පළාත් සභාව මගින් පැවැත් වූ කාර්ය සාධන තරඟ වලින් මුල්තැන මෙම සභාවට හිමි වූ අතර ජාතික ඵලදායීතා තරඟයෙන් පළමු ස්ථානය ලබාගැනීමට ද මෙම සභාවට හැකි වූ බැව් සතුටින් යුතුව සදහන් කරන බැව් දැන්වීය.

තව දුරටත් කථා කළ ගරු සභාපතිතුමා , 2011 වර්ෂය සඳහා අයවැය කෙටුම්පත සකස් සකස් කිරීමට ප්‍රථම ප්‍රසිද්ධ දැන්වීම් , බැනර්, රාජ්‍ය නිලධාරීන් , රාජ්‍ය ආයතනය , ස්වේච්ඡා සංවිධාන ,පුරවැසි කමිටු සහ අන්තර්ජාලය ඔස්සේ මහජනතාවගේ අදහස් හා යෝජනා ලබාගත් බැව් පැවසීය. එම යෝජනා පෙළගස්වමින් සභාව වෙත ඉදිරි වර්ෂයේ දී ලැබේයැයි අපේක්ෂිත ආදායම ඇස්තමේන්තුකර එම ආදායම එක් එක් වැය ශිර්ෂයන් වෙත වෙන්කර ඒ යටතේ මහජන සේවාවන් හා සංවර්ධන කාර්යයන් ඉටුකිරීමට ක්‍රියාකරනු ලබන බව දැන්වීය. මෙම අයවැය මගින් ජනතාවට බදු බරක් පටවා නොමැති අතර, නාගරික ජනතාවගේ සුභසිද්ධිය උදෙසා ශිෂ්‍යත්ව ආධාර ලබාදීම/වැසිකිලි ආධාර/නිවාස ආධාර ලබාදීම වැනි සුභසාධක සේවාවන් සඳහා ද ප්‍රතිපාදන වෙන්කර ඇති බැව් දැන්වීය.

1980 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගන්නා ලද බළන්ගොඩ තානායම නැවත මෙම සභාව වෙත පවරාගෙන පළාත් සභා හා නගර සභා මුදල් ලක්ෂ 80 ක පමණ මුදලක් වැය කර නවීකරණය කර නගරයට පැමිණෙන ආගන්තුකයින්ට සුව පහසු අන්දමින් තමන්ගේ විවේවකය ගතකිරීම සදහා ජනතා අයිතියට පැවරීමට ක්‍රියාකල බැව් දැන්වීය. මෙම තානායම නවීකරණය කිරීම සදහා සබරගමුව පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමන් ලක්ෂ 47 ක මුල්‍ය ප්‍රතිපාදන වෙන්කර දුන් බැව් සදහන් කල අතර , තානායමේ දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ද ලක්ෂ 30 ක මුදලක් පළාත් පාලන කොමසාරිස් විසින් වෙන්කර ලබාදුන් බැවින් , අද දින එම දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල්ගල තැබූ බව දැන්වීය. සබරගුමව පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමන් මෙම සභාවේ කටයුතු වලට විශාල සහයෝගයක් ලබාදෙන බැව් ගෞරවයෙන් යුතුව සදහන් කරන අතර ඒ සම්බන්ධව මෙම සභාවේ ස්තුතිය එතුමන් වෙත පිරිනමන බවද දැන්වීය. එසේම , බළන්ගොඩ නගරයට විශාල අඩුපාඩුවක්ව පැවති මහජන පොළ සකස් කර ඇති අතර , ලබන මස 18 වන දින එය ජනතා අයිතියට පැවරීමට ක්‍රියාමාර්ග ගන්නා බැව දැන්වීය. එසේම , නව ක්‍රීඩාපිටියක් හා නගර ශාලාවක් ලබන වර්ෂය තුළ ඉදිකිරීමට අපේක්ෂා කරන බැව් සදහන් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වන ගම නැගුම මග නැගුම ව්‍යාපෘතිය යටතේ විශාල මුදල් සම්භාරයක් මෙම සභාව වෙත ලැබුණු අතර , එම මුදල්උපයෝගී කරගෙන සංවර්ධන වැඩ කටයුතු රැසක් ඉටුකල බවත් මෙම සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරුන්ට තමන් නියෝජනය කරනු ලබන ග්‍රාම සේවා වසම් වල පවතින අඩුපාඩු සකස් කිරීමට අවස්ථාව උදා වූ අතර , ඒ තුළින් පළාත් පාලන නියෝජිතයින්ට ජනතාව සමග සමීපව කටයුතු කිරීමට අවස්ථාව උදා වූ බැව් දැන්වීය.

මෙම නගර සභාව ඉතා සාර්ථකව කසළ කළමනාකරණය කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කර ඇති අතර දිවයිනේ බොහෝ පළාත් පාලන ආයතන වල නිලධාරීන් හට කසල කළමණාකරනය සම්බන්ධව නේවාසික පුහුණු වැඩ සටහන් ද පවත්වන අතර , ඊට අමතරව අභ්‍යාසලාභී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට ද නේවාසික පුහුණු වැඩ සටහන් පැවැත්වීමට ක්‍රියාකරනු ලබන බව දැන්වීය.උතුරු නැගෙනහිරි ප්‍රදේශයන්හි ද පළාත් පාලන ආයතනවල නිලධාරීන් හටද කසළ කළමනාකරණය කිරීමේ පුහුණු වැඩ සටහන් පවත්වන ලෙස ඉල්ලා ඇති අතර ඉදිරියේ දී මඩකලපුව කාතන්කුඩි ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් හට ද කසළ කළමනාකරණය කිරීමේ වැඩ සටහනක් පැවැත්වීමට ආරාධනා කර ඇති බව දැන්වීය.

මෙම සභාවේ කටයුතු වලට රාජ්‍ය ආයතන ප්‍රදේශවාසී ජනතාවගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කරන බැව් දැන් වූ අතර , බළන්ගොඩ සිංහ සමාජය මෙම නගර සභාව වෙත ගිනි නිවන රථයක් පරිත්‍යාග කල බැව් ස්තුති පූර්වකව සදහන්කරන අතර , ඉදිරියේදීද , සියළු දෙනාගේම සහයෝගය මෙම සභාව වෙත ලබාදෙන ලෙස ඉල්ලමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

05. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **මග දෙපස නාම පුවරු සවිකිරීම සම්බන්ධවයි**

පරිසරය සුරැකීමේ අගය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම අරමුණු කරගනිමින් LIC ලංකා සමාගමේ නම සඳහන් නාමපුවරු නොමිලයේ මාර්ග දෙපස සවිකර ප්‍රදර්ශනය කිරීමට එම ආයතනය බලාපොරොත්තු වන අතර , ඒ සඳහා වියදම් ඇස්තමේන්තුවක් ලබාදෙන ලෙස ඉල්ලා , එම සමාගමේ කළමණාකරු විසින් එවා ඇති 2010.10.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

වියදම් ඇස්තමේන්තුව සකස් කිරීමටත් නාම පුවරු සවිකිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:02 **බළන්ගොඩ,බෝවත්ත - කල්තොට මාර්ගයට අපද්‍රව්‍ය හා අප ජලය බැහැරකිරීම:**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ අංක: 383 , දෙහිගස්තලාව යන ලිපිනයේ පදිංචි එම්.කේ.එම්.තාමෙල් මහතා අමතමින් මෙම නගර සභාවේ ගරු සභාපතිතුමාට පිටපත් සහිතව පැල්මඩුල්ල මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු විසින් එවා ඇති 2010.07.18 දිනැති ලිපිය සභාගත කරනලදී.

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බළන්ගොඩ , බෝවත්ත , කල්තොට මාර්ගයේ කි.මි.0-3 දක්වා කොටසේ කාණු පද්ධතිය අවහිරවීම නිසා මාර්ගයේ ගමන් ගන්නා ජනතාව හා පාසැල් සිසුන් බලවත් අපහසුතාවයකට පත්ව ඇති බැවින් , එම අවහිරතාව මගහැරවීමට මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර , ඉහත සඳහන් එම්.කේ.එම්.තාමෙල් යන අය ප්‍රධාන මාර්ගයට අපද්‍රව්‍ය හා අප ජලය බැහැර කිරීම නිසා මාර්ගයේ ජලය රැඳී තිබීම මගින් මදුරුවන් බෝවීමේ අවධානමක් පවතින බැවින් අපද්‍රව්‍ය හා අපවිත්‍ර ජලය ප්‍රධාන මාර්ගයට බැහැර කිරීම වහාම නැවැත්වීමට ක්‍රියමාර්ග ගන්නා ලෙස එමගින් දන්වා තිබිණ.

මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා ලවා මේ සම්බන්ධව පරීක්ෂා කරබලා ප්‍රධාන මාර්ගයට අප ජලය බැහැර කිරීම නැවැත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:03 **2011 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම :**

2011 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් පුවත්පත් දැන්වීමක් පළකල යුතුව ඇති බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

2011 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:04 **ගිනි නිවන රථයට කැසට් යන්ත්‍රයක් සවිකිරීම :**

මෙම නගර සභාව සතු ගිනි නිවන රථයට කැසට් යන්ත්‍රයක් සවිකිරීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:05 **පුස්තකාල පොත් මිළදී ගැනීම :**

2010 වර්ෂය වෙනුවෙන් පුස්තකාල පොත් මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරනලදී.

අවශ්‍ය පොත් ප්‍රමාණය මිළදී ගැනීමට සභාවේ සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:06 **ජල බවුසරයක් සඳහා ලොරි රථයක් මිළදී ගැනීම**

බළන්ගොඩ නගර සභාවේ ජල බවුසරයක් සඳහා ලොරි රථයක් මිළදී ගැනීමට කැඳවන ලද මිළ ගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.

ස.තො.ස.මෝටර්ස් වෙතින් ඉදිරිපත් කර ඇති මිළ ගණන පහත දැක්වේ.

| | | |
|---|---|---|
| Make | - | ISUZU |
| Country of Origin | - | JAPAN |
| Year of Manufacture | - | 2010 |
| Model | - | ISUZU Brand New 3 Ton Payload Chassis /Cab Model NMR71E-21 with 4HGI Engine Rear Double Wheel Double Battery ( Engine Capacity 4570CC ) |

- Deck Length 10 ft
- Power Steering
- Power Window , Power Shutter
- Heater / Blower , Central Locking
- AM /FM Radio , Dual Tone Horn
- 3 Speed with intermittent wiper/Washer
- Two Sun visors
- 5 Speed Manual Transmission
- Outside & Inside Rear View Mirrors
- Reverse Warming Buzzer
- Spare Wheel , Tools , Jack , etc

| | | |
|---|---|---|
| Nett Selling Price | - | Rs. 3,23,5000.00 |
| V.A.T.12% | - | Rs 388,200.00 |
| Total Selling Price | - | Rs. 3,623,200.00 |

- Charges of Locally Fitted A/C Rs. 55,000.00

ඉසුසු වර්ගයේ ලොරි රථ ගෙන්වනු ලබන්නේ ස.තො.ස.මෝටර්ස් පී.එල්.සී. ආයතනයෙන් පමණක් බැවින් අදාළ ලොරි රථය මිළදී ගැනීම එම ආයතනයෙන්ම සිදුකර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කල අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ලොරි රථය මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:07 **අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි නිෂ්පාදනය කිරීම**

බළන්ගොඩ මුගුණමලේ පර්චස් 40 තුළ වූ ඉඩම් කොටසේ කොන්ක්‍රීට් කුට්ටි නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන අතර , ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති 2010.11.10 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලද අතර , ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමට තීරණය කරන ලදී.

05:08 **සුදර්ශනගම මාර්ගය සංවර්ධනය කිරීම :**

ගමනැගුම ව්‍යාපෘතිය යටතේ ඉහත සඳහන් මාර්ගය සංවර්ධනය කිරීම මෙම දිනවල සිදුකරනු ලබන හෙයින් , ඊට සමගාමීව මෙම මාර්ගයේ ඉතිරි මීටර් 25 ක කොටස සකස් කරදෙන ලෙස ඉල්ලා සුදර්ශනගම ඉහල කොටස ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කර ඇති 2010.11.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

අදාල මාර්ග කොටස සකස් කරදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:09 **බළන්ගොඩ පොදු වෙළඳසැල සාප්පු කඩ- ආර්ථික වටිනාකම තක්සේරුකිරීම:**

බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළඳසැල කඩ කාමරවල වර්තමාන මාසික ආර්ථික කුළිය සබරගමුව පළාත් තක්සේරුකරු විසින් තක්සේරු කර ඇති අතර සාප්පු කඩ වලට අදාළ තක්සේරුව ඉතාමත් වැඩි බැව් කඩහිමියන් ප්‍රකාශ කල බැවින් ඒ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවක් පවත්වන ලද අතර , එහිදී නැවත තක්සේරුවක් කිරීමට තීරණය වූ බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

නැවත තක්සේරුවක් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:10 **එකලා විදුලි සේවාව තෙකලා කිරීම :**

ඉහත සඳහන් කරුණට අදාළව ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි ඉංජිනේරු විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ නගර සභාවේ පොහොර හලන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා එකලා විදුලි සැපයුම ලබා දී ඇති විදුලි මාර්ගයෙහි තෙකලා පරිවර්ථනය සිදුකර , බැර තුලනය කර නියමිත වොල්ටීයතාවයෙන් යුක්ත වන පරිදි දැනටමත් සකස් කර ඇති අතර , 2010.10.14 දිනැතිව මෙම නගර සභාවෙන් කර ඇති ඉල්ලීම අනුව මෙම ස්ථානයට තෙකලා විදුලි සේවාව ලබාදීම සඳහා රු.26270/- ක මුදලක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවන ලෙස එමගින් දන්වා තිබිණ.

අදාල මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:11 **ශෛලතලාරාම මාවත හා කාණු පද්ධතිය සකස් කරගැනීම :**

උක්ත කරුණට අදාළව , ශෛලතලාරාම විහාරස්ථානයේ විහාරාධිපති ස්වාමීන්වහන්ස විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ කිරිඳිගල ශෛලතලාරාම පාර වලවල් සෑදී ඉතා අබලන් තත්ත්වයට පත්ව ඇති අතර , ඇතැම් නිවෙස් වලින් බැහැර කරනු ලබන කසළ කාණුවට දැමීම නිසා කාණුව ගොඩ වී ඇති අතර , දුරකථන කුළුණු ද කාණුවේ සිටුවීමෙන් කාණුව අවහිර වී ඇති බැවින් , කාණු පද්ධතිය සහ මාර්ගය සකස් කරදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

ටෙලිකොම් ආයතනය වෙත දන්වා දුරකථන කණු ඉවත් කරවීමටත් ශ්‍රමදානයක් සංවිධානය කර මාර්ගය සකස් කරදීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:12 **උපදේශක සේවා ගාස්තු ලබාගැනීම: බළන්ගොඩ සතිපොළ ඉදිකිරීම**

ඉහත සඳහන් කර්මාන්තය ඉටුකිරීමේ දී උපදේශන සේවා ගාස්තු ලබාගැනීමට අදාළව බළන්ගොඩ විධායක ඉංජිනේරු විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

- කරන ලද වැඩවල වටිනාකම 26626714.70
- ලැබීමට ඇති උපදේශන සේවා ගාස්තුව වැඩ වටිනාකමින් 4.5% 1243202.16

ඉහත සඳහන් ගාස්තු ගෙවීම සම්බන්ධව ප්‍රධාන ලේකම්ගේ උපදෙස් ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:13 **රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම යෝජනා ක්‍රියාත්මක කිරීම:**

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් පැල්මඩුල්ල මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු විසින් එවා ඇති 2010.11.02 දිනැති ලිපිය සභාගත කරනලදී.

බළන්ගොඩ නගර සභාව වෙත පහත සඳහන් කොන්දේසි වලට යටත්ව වටරවුම් නඩත්තු කිරීම සඳහා භාරදිය හැකි බවත් , ඒ සඳහා එකඟතාවය පළකරන ලෙසත් එමගින් දන්වා තිබිණ.

- මාර්ග රක්ෂිතවල හා වටරවුම් තුළ වෙළඳ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය සඳහා බාහිර වෙළඳ ආයතනයකට භාර දෙන්නේ නම් එම දැන්වීම් ප්‍රදර්ශන ගාස්තු මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතුය.

ඉහත කොන්දේසි වලට එකඟව වටරවුම් නඩත්තු කිරීම සඳහා සභාවේ එකඟතාව පළකරන ලදී.

05:14 **2010 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය :**
ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ නගර සභාවේ ප්‍රධාන කාර්යාලය , ගබඩාව , පෙර පාසැල, අයුර්වේදය , ක්‍රීඩාගාරය,කොම්පෝස්ට් ව්‍යාපෘතිය , විදුණැන පියස, සම්පත් පියස,ලේකම් නිල නිවස,වැව්වත්ත හා ඕළුගන්තොට ප්‍රජා ශාලා හා මහජන පුස්තකාලය වන අංශ වලට අදාළව සමීක්ෂණය කල යුතු වන අතර , ඒ සඳහා පහත නම් සඳහන් සමීක්ෂණ මණ්ඩලය පත්කිරීම සුදුසු බැව් සඳහන් කර තිබුණි.

| | |
|---|---|
| 1. සභාපති | ප්‍රධාන කළමනාකරණ සහකාර , එම්.එච්.සීලවතී මිය |
| 2. සාමාජික | කළමනාකරණ සහකාර පී.මංගලිකා දමයන්ති මිය |
| 3. සාමාජික | වැඩ සටහන් සහකාර ඕ.කේ.නිලන්ති මෙනවිය |
| 4. සාමාජික | වැඩ සටහන් සහකාර , සංජී වසන්ති මිය |
| 5. සාමාජික | කළමනාකරණ සහකාර , කුමාර සෙනෙවිරත්න මයා |

මහජන පුස්තකාලයේ පොත් සමීක්ෂණය සඳහා පුස්තකාලයාධිපති එස්.එච්.ප්‍රේමරත්න මහත්මිය සමග එහි සේවය කරන කාර්ය මණ්ඩලය සහභාගිකරවීම සුදුසු යැයි යෝජනා කර ඇති අතර , බළන්ගොඩ නගර සභාවේ තානායමේ භාණ්ඩ සමීක්ෂණය සඳහා පහත නම් සඳහන් සමීක්ෂණ මණ්ඩලය සහභාගී කරවීම සුදුසු වන අතර , මෙම කාර්යය අධීක්ෂණය කිරීම සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙකු පත්කරගැනීම ගැනීම සුදුසු බැව් යෝජනා කර තිබුණි.

බළන්ගොඩ නගර සභා තානායමේ භාණ්ඩ සමීක්ෂණය කිරීමේ සමීක්ෂණ මණ්ඩලය

| | | |
|---|---|---|
| 01. | සාමාජික | වැඩ සටහන් සහකාර ,රජිත කොස්වත්ත මහතා |
| 02. | සාමාජික | කළමනාකරණ සහකාර එම්.ඩී.ගුණසේකර මහතා |
| 03. | සාමාජික | කාර්යාල කාර්ය සහායක එම්.ජී.ප්‍රේමදාස මහතා |
| 04. | සාමාජික | තානායම් කළමනාකරු, නෙරන්ජන් සෝමරත්න මහතා. |

2010 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීමටත් , එම කාර්යය අධීක්ෂණය සඳහා ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රුමි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා පත්කිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:15 **" දැයට සෙවන " ජනාධිපති උත්තමාචාර රුක් රෝපණ වැඩ සටහන - 2010.11.15**

ඉහත සඳහන් කරුණට අදාළව සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් එවා ඇති 2010.10.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ ජන්ම දිනය සැමරීම සඳහා 2010.11.15 වන දින දීප ව්‍යාප්ත එකලොස් ලක්ෂයක් ( 1,100,000 ) ක් පැළ සිටුවීමේ ජාතික වැඩ සටහනක් සංවිධානය කර ඇති අතර , මෙම වැඩ සටහන සාර්ථක කරගැනීම සඳහා ගෙන ඇති පියවර, එහි ප්‍රගතිය හා හඳුනාගත් ගැටළු පිළිබඳ විශේෂ සාකච්ඡාවක් ගරු පරිසර අමාත්‍ය අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා සහ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් 2010.11.08 වන දින පෙ.ව.09.30 ට සබරගමුව පළාත් සභා ශ්‍රවණාගාරයේ දී පැවැත්වෙන බැවින් ,මෙම අවස්ථාව සඳහා නොවරදවාම සහභාගීවන ලෙසත් මෙම ආයතනය විසින් මෙම වැඩ සටහනට දායකත්වය සපයමින් සිදුකරනු ලබන රුක් රෝපණ සංඛ්‍යාව හා ස්ථානයන් පිළිබඳ විස්තර වාර්තාවක් 2010.11.03 දිනට පෙර එවීමට කටයුතු කරන ලෙසත් එමගින් දන්වා තිබිණ.

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ සෑම නිවසකම පැළයක් රෝපණය කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:16 **බළන්ගොඩ තානායමේ නව දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම :**

බළන්ගොඩ තානායමේ නව දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ආධාර වැය ශීර්ෂයෙන් රු.300,000.00 ක මුදලක් වෙන්කර ඇති බැවින් ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර එවීමට කටයුතු කරන ලෙස ඉල්ලමින් පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඇස්තමේන්තුව සකස් කර ඉදිරිපත් කිරීමටත් , සෘජු කම්කරු ශ්‍රමය යටතේ කර්මාන්තය ඉටුකිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:17 **පළාත් පාලනය පිළිබඳ පුරෝගාමී සමුළුව - 2010**

උක්ත කරුණට අදාළව උතුරු පළාත් පාලන සහන හා පුනරුත්ථාපන , සමුපකාර,ග්‍රාම සංවර්ධන , කර්මාන්ත , සමාජ සේවා පරිවර්තන හා ළමා රක්ෂණ සේවා අමාත්‍යාංශ ලේකම්ගේ අංකඃ NP/05/03/03/SYM හා 2010.10.20 දිනැති ලිපිය අනුව වවුනියාවේ දී පැවැත්වෙන පළාත්

පාලනය පිළිබඳ පුරෝගාමී සමුළුව සඳහා බළන්ගොඩ නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය සහභාගී කරවීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින් , ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් , ප්‍රධාන ලේකම් වෙත යවන ලද ලිපියක පිටපතක් සභාගත කරන ලදී.

මෙම සම්මේලනයට සහභාගීවීමට සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙනලදී.

05:18 **හිඟ මුදල් වරිපනම් ලේඛනයෙන් කපා ඉවත් කිරීම :**

බළන්ගොඩ හපුතලේ පාර අංකඃ 26/5 , 30/13,30/14,30/17 හා 30/18 යන කඩ කාමර එම්.එල්.එම්.අබුසාලී මහතා නමින් ලේඛනගතව ඇති දොරවෙල ඔය හා දැනට පවතින සතිපොළ අතර පැවති අනවසර කඩ කාමර කිහිපය දැනට වර්ෂ ගණනාවක සිට කඩා ඉවත්කර ඇති නමුත් වරිපනම් බිල්වෙමින් පවතින බැවින් , මෙම දේපල සහ හිඟ වරිපනම් ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරනලදී.

පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව හිඟ මුදල් වරිපනම් ලේඛනයෙන් කපා හැර අදාල දේපල ලේඛනයෙන් ඉවත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:19 **2010 නොවැම්බර් මස විශේෂ මහා සභා රැස්වීම :**

බළන්ගොඩ බෝම්බුව බෝධි මණ්ඩලාරාම විහාරස්ථානයේ වස් කාලය හා කඨින චීවර පූජාව 2010.11.12,13 යන දිනට යෙදී ඇති අතර , මෙම විහාරස්ථානයට අදාළව මෙම සභාවේ ගරු සභාපතිතුමන් සමග ආරවුලක් පවතින බැවින් , 2010 නොවැම්බර් මස 10 වන දින පැවැත්වීමට නියමිත විශේෂ මහා සභා රැස්වීමට සහභාගීවීමට නොහැකි බැව් සඳහන් කරමින් එම විහාරස්ථානයේ විහාරාධිපති වටද්දර ඥාණිස්සර හිමියන් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ පෙට්ටිගල පාරේ පිහිටි පූජාපිටියවත්ත නොහොත් බෝගහවත්ත නැමති ඉඩම බළන්ගොඩ නගර සභාව සතු එකක් බවත් , එම ඉඩමේ භුක්තිය 1995.04.05 වන දින නගර සභාවට භාරදීමට උසාවි නියෝගය අනුව පිස්කල් නිලධාරී ඇතුළු කණ්ඩායමක් ඉහත සඳහන් ස්ථානයට ගිය අතර විහාරාධිපති ස්වාමීන් වහනසේ ඊට බාධා කල බැවින් එම නියෝගය ක්‍රියාත්මක කිරීමට නොහැකි වු බැව් ගරු සභාපතිතුමා විසින් දැන්වීය.

මෙම හේතුව නිසා මෙම ඉඩම හරහා ඇති මාර්ගය සංවර්ධනය කිරීමට නොහැකි වී ඇති බවත් මෙම මාර්ගය හා ඉඩමේ පිහිටි වොලිබෝල් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා මුදල් ලැබී ඇති හෙයින් මෙහි භුක්තිය නැවත භාරගැනීම සඳහා පැන නැගී ඇති බාධක ඉවත් කරගැනීමට අවශ්‍ය කටයුතු කිරීම යැයි දැන්වීය.

විහාරාධිපති ස්වාමීන් වහන්සේ සමඟ ආරවුලක් ඇතිනොකරගෙන මෙම ගැටළුව විසඳන ලෙස ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

05:20 **බළන්ගොඩ පුපුලවත්ත මාර්ගය සංවර්ධනය කිරීම :**

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයට අයත් කුමාරගම ප්‍රදේශයේ නිවාස 08 යාමට භාවිතා කරනු ලබන අඩිපාර ( පුපුලවත්ත මාර්ගය ) පිළිසකර කරදෙන ලෙස ඉල්ලා , කුමාරගම ප්‍රදේශවාසීන් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

2011 වර්ෂයේ අයවැය ලේඛනයට ඇතුළත් කර ඉටුකරදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:21 **බළන්ගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු අයකිරීමේ සේවාව බදුදීම සඳහා ලංසු කැඳවීම :**

2011 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවේ රථවාහන නැවතුම් ගාස්තු අයකිරීමේ සේවාව බදුදීම සඳහා ලංසු කැදවීමට පසුගිය සභාවේ දී තීරණය කර ඇති බැවින් දැනට අයකරනු ලබන මාසික කුළිය අවම ලංසුව සේ සලකා පුවත්පත් දැන්වීම් පළකර ටෙන්ඩර් කැඳවීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ලංසු කැඳවීම සඳහා සභවේ අනුමැතිය ලබාදෙන ලද අතර , නොවැම්බර් මස මහා සභා රැස්වීමේ දී ලංසුපත් විවෘත කිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:22 **ටෙන්ඩර් ඇප තැන්පතු ආපසු ගෙවීම :**

2009 වර්ෂයේ දී බළන්ගොඩ පොදු වෙළඳසැල මාළු කඩ 2010 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමේ දී ටෙන්ඩර් අයදුම්පත් ලබාගන්නා ලද ජී.ඩබ්.සිරිපාල ද සිල්වා මහතා සහ ජී.ඩබ්.සමන් තුෂාර ප්‍රියදර්ශන මහතා ටෙන්ඩර් ඇප තැන්පතු වශයෙන් තබන ලද මුදල් ආපසු ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර , පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීඑල්ජී/6126 හා 2010.10.05 දිනැති ලිපිය අනුව අදාල තැන්පතු ආපසු ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බැවින් , අදාල ඇප තැන්පතු ආපසු ගෙවීමට අනුමැතිය ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

ඉහත සදහන් අය විසින් තැන්පත් කර ඇති ඇප තැන්පතු ආපසු ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:23 **2011 වර්ෂය සඳහා මස්කඩ ටෙන්ඩර් කිරීම :**

2011 වර්ෂය සඳහා පොදු වෙළඳසැල මස්කඩ ටෙන්ඩර් කිරීම පිළිබඳ ටෙන්ඩර් මණ්ඩල වාර්තාව සභාගත කරන ලදී.

ඒ අනුව පොදු වෙළඳසැල අංකඃ 15 දරණ එළුමස් කඩය සහ අංකඃ 16 දරණ එළහරක් මස් කඩය බළන්ගොඩ , මිරිස්වත්ත , කහටපිටිය පාරේ ඩීන් මොහොමඩ් ෆලීල් මහතා විසින් ලබාගෙනඇති අතර , අංකඃ 17 දරණ කුකුළු මස් කඩය සම්බන්ධයෙන් ඉදිරිපත් වී තිබූ ටෙන්ඩර් අයදුම්පත්‍ර 04 අතුරින් වැඩිම මිළ ගණනක් සටහන් කර තිබූ මෙහොමඩ් රියාස් බුහාර් මහතාගේ ටෙන්ඩර් අයදුම්පත්‍රය සමඟ සාතකාගාරයේ බලපත්‍රවල පිටපත් නොතිබුණ බැවින් , එම බලපත්‍ර ඉදිරිපත් කිරීම සඳහා දින 07 ක කාලයක් ලබා දී තිබූ නමුත් , එම කාලය තුළ අදාළ බලපත්‍ර පිටපත් ලබාදීමට ඔහු අපොහොසත් වී තිබූ බැවින් , දෙවන ටෙන්ඩර්කරු විමසා තිබූ අතර , එම මුදලට ටෙන්ඩරය ලබාගැනීම ප්‍රතික්ෂේප කරමින් එවා ඇති ලිපිය ද සභාවට ඉදිරිපත් කර තිබුණි.

මේ පිළිබඳව සලකා බැලූ සභාව , පොදු වෙළඳසැල අංකඃ 15 හා 16 දරණ කඩ කාමර සම්බන්ධව ටෙන්ඩර් මණ්ඩල තීරණයට සභාවේ අනුමැතිය ලබාදුන් අතර , අංකඃ 17 කඩ කාමරය සඳහා තෙවන අයදුම්කරු විමසීමට තීරණය කරන ලදී.

05:24 **බළන්ගොඩ කාර්පාක් අංකඃ 06 කඩ කාමරය පිළිබඳවයි**

ඉහත සඳහන් කරුණට අදාළව සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2010.11.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉහත කරුණ සම්බන්ධයෙන් අංකඃ 17 අනඳමෙත්ගම , කිරිඳිගල , බළන්ගොඩ පදිංචි ඩබ්.එල්.ආනන්ද මහතා විසින් 2010.07.07 දින ගරු ආණ්ඩුකාරතුමා වෙත යවන ලද ලිපිය සම්බන්ධව කල පරීක්ෂණයේ තොරතුරු මත අංකඃ 06 දරණ කඩ කාමරය බළන්ගොඩ නගර සභාව විසින් ඩබ්.එල්.ආනන්ද නැමති අයගෙන් කුළී ගෙවීම පැහැර හැරීම මත ගිවිසුම් ප්‍රකාරව ආපසු පවරා ගැනීම නීත්‍යානුකූලව සිදුකරන ලද්දක් වේ.

කඩ කාමරය බදුදීමේ චක්‍රලේඛ උපදෙස් මත ටෙන්ඩර් මගින් වෙනත් පුද්ගලයෙකු වෙත බදු දී ඇති බැවින් ඩබ්.එල්.ආනන්ද මහතාගේ ඉල්ලීම පරිදි එය නැවත ඔහු වෙත ලබාදීමට හැකියාවක් නොමැති බැවින් ඔහු විසින් මේ සම්බන්ධව විකල්ප සහනයක් අපේක්ෂා කරන්නේ නම් මෙම සභාවෙන් ඉල්ලුම් කිරීමෙන් පසු ඒ සම්බන්ධව කටයුතු කිරීමේ බාධාවක් නොමැති බැව් එමගින් අවධානය කර තිබුණි.

ඉහත අංක 06 දරණ කඩ කාමරය නැවත ටෙන්ඩර් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:25 **ජාතික පාසල් වටරවුම් පාර කොන්ක්‍රීට් කිරීම ii අදියර**

දෙහිගස්තලාව හා කුමාර යන ග්‍රාම සේවා වසම් දෙකට අතරමැදිව තිබෙන ජාතික පාසල් වටරවුම් පාර ii අදියර කොන්ක්‍රීට් කිරීම සම්බන්ධව ප්‍රදේශවාසී ජනතාවගේ ස්තුතිය පළකරමින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

එම ප්‍රදේශවාසී ජනතාවට පානීය ජලය නොමැති බැවින් 2011 වර්ෂයේ දී එම ප්‍රදේශයට ජලය ලබාදෙන ලෙස එමගින් වැඩිදුරටත් සඳහන් කර තිබුණි.

මෙම ඉල්ලීම ජල සම්පාදන මණ්ඩලය වෙත යොමුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:26 **පාර වැසීම සම්බන්ධවයි**

බළන්ගොඩ බැංකියවත්ත සඳුන්ගම ඉඩම අංකඃ 860 දරණ ප්ලෑන අනුව වෙන්කර ඇති අඩි 03 ක පාර අවහිර කරමින් එම මාර්ගය අසල පදිංචි අයෙකු ගේට්ටුවක් යොදා ඇති බැවින් මාර්ගයේ ගමන් කරන ජනතාව අපහසුතාවකට ලක්ව ඇති නිසා ගේට්වුව ඉවත් කර එම අවහිරතාව වැලැක්වීමට කටයුතු කරන ලෙස ඉල්ලමින් , බළන්ගොඩ සඳුන්ගම එස්.අයි.ඒ.අයිසෙක් , ජී.සිවකුමාර් යන අයගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව කාර්මික නිලධාරී මහතා ලවා පරීක්ෂා කර නීත්‍යානුකූලව කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06. **2011 වර්ෂය සඳහා අයවැය කෙටුම්පත සභාගත කිරීම ඃ**

2011 වර්ෂය සඳහා සකස් කර ඇති අයවැය කෙටුම්පත සභාගත කරන ලදී.

මෙම අයවැය මගින් ජනතාව වෙත බදු බර පටවා නොමැති අතර , ජනතා අවශ්‍යතාවයන් ඉටුකිරීම සඳහා යෝජනාවන් ඉදිරිපත් කර ඇති බැව් දැන්වීය. ආදායම් උත්පාදක ව්‍යාපෘති ආරම්භ කිරීමට අපේක්ෂා කර ඇති අතර , ඒ තුළින් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම ද අරමුණු කරගෙන ඇති බැව් දැන්වීය. මෙම අයවැය කෙටුම්පතේ සංශෝධනයන් සිදුකිරීමට ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින බව ගරු සභාපතිතුමා විසින් දැන්වීය.

| | |
|---|---|
| 2011 වර්ෂයේ පුනරාවර්ථන ආදායම | 69,646,000.00 |
| මුළු පුනරාවර්ථන වියදම | 63,037,000.00 |
| පුනරාවර්ථන අතිරික්තය | 6,609,000.00 |
| ප්‍රාග්ධන වියදම | 6,609,000.00 |
| අතිරික්තය/ ඌණතාවය | - |

**06:01 ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රූමි මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා අදහස් දක්වමින් , 2011 වර්ෂය සඳහා ඉතා හොඳ අයවැයක් ඉදිරිපත් කර ඇති බැව් මෙම අයවැය කෙටුම්පත අධ්‍යයනය කිරීමේ දී පෙනී යන බව පැවසීය. වර්තමාන පාලක පක්ෂය මෙම සභාවේ පාලන බලය ලබාගන්නා අවස්ථාවේදී බළන්ගොඩ නගර සභාවේ අයවැය සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සකස් කර තිබුණු බැවින් , මෙය සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම සකස් කල යුතු බැව් තමන් පෙන්වා දුන් බැව් පැවසීය. ඒ අනුව 2010 වර්ෂයය සඳහා භාෂා තුනෙන්ම අයවැය සකස් කර ප්‍රකාශයට පත්කල බැව් පැවසීය. ඒ සම්බන්ධව සිය ස්තුතිය ලේකම් මහතා /ගණකාධිකාරී මහතා සහ කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත පළකරන බව දැන්වීය.

මෙම නගර සභාවේ ගරු සභාපතිතුමා ඉතාමත් දක්ෂ කාර්යශූර මහජන නියෝජිතයෙකු වන අතර , කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගේම සහයෝගය මත නිරන්තරව මහජන සුභසාධනය උදෙසා කටයුතු කරන බව පැවසීය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම නගර සභාව පළාත් පාලන ආයතනයන්ට ආදර්ශයක් වෙමින් ආදර්ශමත් නගර සභාවක් ලෙස තේරී පත්ව ඇති බව පැවසීය.

මෙම නගර සභාව විසින් කරනු ලබන කාර්යයන් සම්බන්ධව දීර්ඝ ලෙස කරුණු දැක් වූ ගරු මන්ත්‍රීතුමා , බළන්ගොඩ නගර සභාව මේවනවිට ඉතා සාර්ථකව කසළ කළමනාකරණය කිරීමේ වැඩ සටහනක් ආරම්භ කර ඇති අතර , ඒ යටතේ රාජ්‍ය නිලධාරීන්ට කසළ කළමනාකරණය සම්බන්ධව පුහුණුවීම් ලබාදෙන අතර , පාසල් දරුවන් දැනුවත් කිරීම සඳහා ද වැඩ සටහන් සංවිධානය කර ඇති බැව් දැන්වීය.

අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වන ජාතික සවිය,ගම නැගුම , මගනැගුම ව්‍යාපෘතීන් හරහා විශාල සංවර්ධනයක් සිදුව ඇති බව අවධාරණය කල අතර , ඒ යටතේ නගර සභා බලප්‍රදේශයේ ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීමට ද හැකි වූ බැව් දැන්වීය. එම නිසා ඉදිරි පළාත් පාලන මැතිවරණයේ දී ගරු මන්ත්‍රීවරුන්ට ජනතා කැමැත්ත ලබාගැනීම සඳහා නොබියව ඉදිරියට යාමට හැකියාව තිබෙන බැව් දැන්වීය.

මෙම සභාවේ පැවැත්වෙන මහා සභා රැස්වීම් නැරඹීම සඳහා මහ ජනතාවට ආරාධනා කිරීම ඉතා වැදගත් බවත් , ඔවුන් සභාවේ කටයුතු සම්බන්ධව මෙහිදී අවබෝධයක් ලබාගන්නා අතර , තම තමන්ගේ ප්‍රදේශවල පවතින අඩුපාඩු සකස් කරගැනීමට අවධානය යොමු කරන බැවින් සෑම සභා රැස්වීමක්ම නැරඹීම සඳහා ජනතාවට ආරාධනා කරන ලෙස ඉල්ලීමක් කරන ලදී. එසේම ඔවුන්ට අදහස් දැක්වීමට විනාඩි 05 ක පමණ කාලයක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

**06:02 ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් බළන්ගොඩ නගර සභාව ජනතා සුභසිද්ධිය උදෙසා විශාල මෙහෙවරක් ඉටුකරනු ලබන ආයතනයක් ලෙස හැඳින්විය හැකි බැව් දැන්වීය. විශේෂයෙන් වර්තමාන පාලක පක්ෂය මෙම සභාවේ පාලන බලය ලබාගැනීමෙන් පසුව බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ සීඝ්‍ර සංවර්ධනයක් සිදුව ඇති බව දැන්වීය. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා ලෙස පත්වීමෙන් පසුව මේ රට තුළ විශාල විපර්යාසයක් සිදු වූ බැව් දැන්වීය. රටට සාමය උදා වී ඇති අතර , රට සෞභාග්‍යමත් කිරීම සඳහා ඉතාමත් කැපවීමෙන් කටයුතු කරනු ලබන බැව් පැවසීය.එතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වන ගම නැගුම මග නැගුම වැනි වැඩ සටහන් ඔස්සේ මුලා ප්‍රතිපාදන වෙන්කරමින් දිවයිනේ සියළුම ප්‍රදේශයන් සංවර්ධනය කිරීමට ක්‍රියාකරන බව සඳහන් කරන ලදී.

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ තමන් නියෝජනය කරනු ලබන කොට්ඨාශ තුළ විශාල සංවර්ධනයක් සිදුව ඇති බැව් පැවසීය. උදා:කුමාරගම ප්‍රදේශයේ ගරාවැටුණු පේෂකර්ම මධ්‍යස්ථානය සංවර්ධනය කර ආදර්ශ පේෂකර්ම මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කර ඇති අතර , මේ වනවිට විශාල පිරිසක් එහි පුහුණුව ලබා ස්වංරැකියාවල යෙදෙන බැව් පැවසීය.

2011 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂාවෙන් යෝජනා රැසක් අයවැයට ඉදිරිපත් කර ඇති බවත් , ඒතුළින් නගරයේ පිරිසිදුකම රැකගැනීම සදහා අලංකාර වූ බාස්කට් කාණුවල එල්ලා තැබීම/නගරයට ග්‍රාම නිලධාරී කාර්යාලයක් ඉදිකිරීම සදහා ඉඩකඩ වෙන්කිරීම ඉන් කිහිපයක් බැව් අවධාරණය කල අතර , 2011 වර්ෂයේ දී එම යෝජනාවන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

බළන්ගොඩ පොදු වෙළඳසැලේ කඩ කාමර සඳහා කුලිය වැඩිකර ඇති බවත් , මෙම කඩ කාමර සඳහා පහසුකම් ලබා දී නොමැති බවත් , යටත් පිරිසෙයින් වැසිකිලි පහසුකම් හෝ සලසා නොමැති බැවින් පහසුකම් වැඩිකර කුලිය වැඩිකිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී. සභාවේ අඩුපාඩු පෙන්වාදෙමින් සභාව නිවැරදි මාවතක යොමුකිරීමට තමන් සෑම අවස්ථාවකදීම කටයුතු කරනු ලබන බවද පවසමින් සිය අදහස් දැක්වීම නිම කරන ලදී.

**06:03 ගරු නාගරික මන්ත්‍රී , ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් , වර්තමාන පාලක පක්ෂය මෙම සභාවට පත්වූවාට පසුව බළන්ගොඩ ප්‍රදේශයට විශාල සේවයක් ඉටුකර ඇති බැවින් ඒ සම්බන්ධව අපට සතුටුවිය හැකි බැව් පැවසීය. සංවර්ධන කටයුතු වලට අමතරව , විශාල මුදලක් වැයකර ඉදිකල බළන්ගොඩ නව බස්නැවතුම්පල ජනතා අයිතියට පැවරීමට හැකි වූ අතර , නගරයට ඉතා අවශ්‍ය පැවති මහජන පොල සකස් කර අවසන්ව ඇති නිසා , ඉදිරියේ දී එය ජනතා අයිතියට පැවරීමට කටයුතු කල හැකි බැව් දැන්වීය. ලබන වර්ෂය තුළ නව ක්‍රීඩාපිටියක් හා නගර ශාලාවක් ඉදිකිරීමට අපේක්ෂිත බැවින් , එම සියළු සංවර්ධන කාර්යයන් සාර්ථක කරගැනීමට හැකිවේවා යි සුභ ප්‍රාර්ථනා කරන ලදී.

**06:04 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා :**

බළන්ගොඩ නගර සභාව දිවයිනේ අනෙකුත් පළාත් පාලන ආයතන වලට ආදර්ශයක් අභිමානවත් සේවයක් සපයන ආයතනයක් බවට පත්ව ඇති බැව් දැන්වීය. මෙම සභාවේ ගරු සභාපතිතුමා දක්ෂ කාර්යශූර නායකයෙකු බවත් , එතුමාට සහය දැක්වීමට ඉතා හොඳ නිලධාරීන් කණ්ඩායමක් සිටින නිසා ජනතා අවශ්‍යතාවන් ඵලදායී ලෙස සපුරාලීමට මෙම සභාවට හැකි වී තිබෙන බැව් පැවසීය. සභාවේ කටයුතු වඩාත් නිවැරදිව කරගෙන යායුතු වන නිසා ඇතැම් විට තර්ක විතර්ක ඉදිරිපත් කිරීමට සිදුවන බැව් පැවසීය. 2011 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනාවන් රැසක් අයවැය ලේඛනට ඇතුලත් කර ඇති අතර , එම යෝජනාවලට අමතරව ක්‍රීඩා උපකරණ ලබාගැනීම වෙනුවෙන් රු.50,000/- ක මුදලක් අයවැය මගින් වෙන්කරන ලෙස ඉල්ලීමක් කරමින් සිය කථාව අවසන් කරන ලදී.

07. **අවසානයඃ-**

**ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ**

අද දින මෙම විශේෂ මහා සභා රැස්වීමේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු උපසභාපතිතුමාටත් , මන්ත්‍රීවරුන්ටත්, ලේකම් මහතාටත් මෙම රැස්වීම නැරඹීම සඳහා පැමිණි සිටි සියළු දෙනාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව. 12.30 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.